# ප්‍රසම්පාදන දැන්වීමයි

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## (කර්මාන්ත අමාත්‍යාංශය) ශ්‍රී ලංකාව

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මදුරාගොඩ කහටගහ පතල් සංකීර්ණයේ අළුත්ම ෆ්‍රොත් ෆ්ලෝටේෂන් යන්ත්‍රාගාරය - BRAND NEW FROTH FLOTATION PLANT ධාරිතාව පැ.මෙ.ටො නිෂ්පාදනය කර, සපයා සවිකොට ක්‍රියාත්මක කරලීමේ ප්‍රසම්පාදනය

01. කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මදුරාගොඩ, කහටගහ පතලෙහි සැකසුම් අංශය සඳහා Brand New Froth Flotation Plant (ITPH) යන්ත්‍රාගාරයක් නිෂ්පාදනය කිරීම, සැපයීම, සවිකිරීම හා ක්‍රියාත්මක කරලීම සඳහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ලංසුකරණය ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණය මගින් මෙහෙයවනු ලැබේ. ජාත්‍යන්තර සැපයුම්කරුගේ දේශීය නියෝජිතයින් නිෂ්පාදක ගේ බලය පැවරීමේ ලිපිය ලංසු ලිපිලේඛන සමග ඉදිරිපත් කළ යුතුය.

03. ශ්‍රී ලංකාව, කොළඹ-05, ඇල්විටිගල මාවත, 561/3, කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සභාපති වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 32,850 ක හෝ ඇ.ඩොලර් 100ක (100 USD) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2023 ජූනි 14 දින තෙක් සමාන්‍ය කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 03.00 දක්වා අභිලාෂී ලංසුකරුවන්ට ලංසුකරණ ලිපි ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

04. ලංසුකරණ ලිපිලේඛන, ඉහත ලිපිනයට ලිඛිත ඉල්ලීමක් සමග ලංසුකරණ ලිපිලේඛන ගෙනැවිත් භාරදීම සඳහා මෙහි සඳහන් කර ඇති පරිදි අයකෙරෙන ගාස්තුව එකතු කළ මුදලට කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් නමට නිකුත් කළ බැංකු අණකරයක් එවූ විට ගෙනැවිත් භාරදිය හැකිය. මෙරට තුළ ගෙනැවිත් භාරදීම සඳහා රු. 19,750 ක ගාස්තුවක් සහ පිටරට එතෙර සඳහා ඇ.ඩොලර් 60 (60 USD) ක ගාස්තුවක් අයකෙරේ.

05. ලංසුකරණ ලිපිලේඛන අයදුම්කරු සඳහන් කර ඇති ලිපිනයට කුරියර් සේවය මගින් එවනු ලැබේ. ලිපිලේඛන නැතිවීම හෝ ප්‍රමාදවී ගෙනැවිත් භාරදීම සම්බන්ධයෙන් වගකියනු නොලැබේ.

06. මුද්‍රා තැබූ ලංසු 2023 ජූනි 14 දින ප.ව. 02.00 ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය නැතහොත් එම ලිපිනයට කුරියර් සේවාව මගින් ලැබෙන්නට සැලැස්විය යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු භාරගැනීම 2023.ජූනි 14 දින ප.ව. 2.00 ට අවසන් වූ වහාම පහත ලිපිනයේදී ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කෙරේ සියලුම ලංසු සමග කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් නමට රු. 328,550 ක හෝ ඇ. ඩොලර් 1000ක (1000 USD) වටිනාකමැති ලංසුකරණ දත්ත පත්‍රිකාවේ (BDS) දී ඇති උපදෙස් පරිදි නිකුත් කළ බැංකු අණකරණයක් මගින් ඉදිරිපත් කළ යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්,**
**561/3, ඇල්විටිගල මාවත, කොළඹ - 05, ශ්‍රී ලංකාව.**

**දුරකථන : +94-112368736/ +94-742024747**
**ෆැක්ස් : +94-112058062**
**ඊ මේල් : kgll@sltnet.lk**